## සැළකිලිමත් වන්න

- සෑම විටම වැඩිපුර රබර් කොපු කිහිපයක් නිවසේ තබා ගන්න
- භාවිතයට පෙර රබර් කොපු පැකට්ටුව ඉරී හෝ පළුදු වී ඇත්දැයි බලන්න
- පැකට්ටුවේ කල් ඉකුත් වන දිනය පසු වී ඇත්නම් භාවිතා කිරීමෙන් වළකින්න
- අධික උණුසුම, හිරු එළිය හෝ තෙතමනය ඇති තැන්වල රබර් කොපු පැකට් තැබීමෙන් වළකින්න
- ළමුන්ගෙන් ඈත් කර තබන්න

ඉතාම කලාතුරකින් රබර් කොන්ඩම භාවිතයේදී රබර් ආසාත්මිකතා ඇතිවිය හැක. මේ සඳහා රබර් නොවන (උදා - කෘතීම පොලිඅයිසොප්‍රීන් Synthetic Polyisoprene) කොන්ඩම පැළඳිය හැකිය

## අසාර්ථක වීමට හේතු

- වැරදි ලෙස පැළඳීම
- රබර් කොපුව ඉරී යාම/ ගැලවී යාම
- පුරුෂ ලිංගය ස්ත්‍රී ලිංග ප්‍රදේශය හා ස්පර්ශ වීමට ප්‍රථම රබර් කොපුව පැළඳ නොසිටීම



## වැඩිදුර උපදෙස් සඳහා හමුවන්න

- සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන්
- වෛද්‍ය නිළධාරීන්
- ලියාපදිංචි වෛද්‍ය නිළධාරීන්
- මහජන සෞඛ්‍ය හෙද සොහොයුරියන්
- පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියන්
- මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්

**සුවසැරිය ✆ 1999**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ
සහ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රකාශනයකි

නිසි කල රිසි ලෙස
දරු සම්පත

**ප්‍රීතිමත්**
**යුග දිවියක් උදෙසා...**



# රබර් කොපුව
# (කොන්ඩමය)

## රබර් කොපුව (කොන්ඩමය)



මෙය රබර් වලින් නිමවූ තුනී කොපුවකි

## ක්‍රියාකාරිත්වය

- ආවරණයක් ලෙස ක්‍රියා කරන බැවින් කාන්තාවගේ යෝනි මාර්ගය තුළට පුරුෂයාගේ ශුක්‍රාණු (පුරුෂ බීජ) ඇතුල් වීම වැළැක්වේ

**රබර් කොපුව (කොන්ඩමය)<br>භාවිතය මගින්<br>ලිංගික සතුටට<br>බාධාවක් ඇති නොවේ**

**රබර් කොපුව (කොන්ඩමය)<br>නිවැරදිව භාවිතා කිරීමෙන්<br>ඒඩ්ස් ඇතුළු ලිංගාශ්‍රිත රෝග බෝවීම ද<br>අවම කරගත හැකිය**

## රබර් කොපුව නිවැරදිව භාවිතා කරන පිළිවෙල

- රබර් කොපුවට හානි නොවන පරිදි පැකැට්ටුව ප්‍රවේශමෙන් විවෘත කරන්න



- පුරුෂ ලිංගය (ශිෂ්ණය) ප්‍රාණවත් වූ පසු පළඳින්න
- රබර් කොපුවේ (කොන්ඩමයේ) පුඩුව ඇඟිලි වලින් තද කර ගන්න
- රබර් කොපුවේ රෝල් කල දාරය උඩු අතට සිටින සේ පුරුෂ ලිංගය මත තබන්න



- පුරුෂ ලිංගය සම්පූර්ණයෙන් ආවරණය වන සේ රබර් කොපුව දිග හරින්න



- ලිංගිකව එකතු වීමෙන් පසු රබර් කොපුවේ දාරය ඇඟිලි වලින් අල්ලා ශිෂ්ණය ප්‍රාණවත්ව තිබියදීම කාන්තාවගේ යෝනි මාර්ගයෙන් පිටතට ගන්න



- භාවිතා කිරීමෙන් පසු රබර් කොපුව නිසි ලෙස බැහැර කරන්න
උදා:- වළ දැමීම, පිළිස්සීම

**යම්කිසි හේතුවක් නිසා<br>කොන්ඩමය අසාර්ථක වූ බවට සැකයක්<br>මතු වුවහොත් හදිසි පවුල් සැලසුම්<br>ක්‍රමයක් හැකි ඉක්මනින් භාවිතා කල යුතුය.**

**ලිංගිකව එකතු වන සෑම විටම අලුත් රබර් කොපුවක් (කොන්ඩමයක්) භාවිතා කළ යුතු වේ**